# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,368 — 1938ක්වූ මැයි මස 11 වෙනි දිනවූ බදාදා.

# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## උපාඞ්ග නීති.

### 1920සේ අඞ්ක 1 දරන අධ්‍යාපන ආඥාපණතය.

1920සේ අඞ්ක 1 දරන අධ්‍යාපන ආඥාපණත යටතේ මඩකලපුවේ ආදායම් දිස්ත්‍රික්කය පිළිබඳ අධ්‍යාපන දිස්ත්‍රික් කාර්‍ය සභාව විසින් සාදා අධ්‍යාපන සභාව විසින් අනුමත කොට ලඞ්කාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් තමන් වහන්සේට පූර්වෝක්ත කොටසින් හා 1931 ලඞ්කා (රාජ්‍ය සභාවේ) රාජපණතින් පැවරී තිබෙන බලය අනුව ස්ථිරකරනලද අතුරු ව්‍යවස්ථාවකි.

මීට,
උතුමාණන්වහන්සේගේ නියමය පරිදි,
සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර,
අධ්‍යාපන අමාත්‍යතුමා.

1938 මැයි මස 6වන දින කොළඹ
අධ්‍යාපන අමාත්‍යතුමාගේ කාර්‍යාලයේදීය.

### අතුරු ව්‍යවස්ථාව.

1930 සැප්තැම්බර් මස 19වෙනි දින හා අංක 7,806 දරන ගැසට් පත්‍රයේ පළවූ අතුරු ව්‍යවස්ථාවෙන් සංශෝධිත 1928 දෙසැම්බර් මස 14වෙනි දින හා අඞ්ක 7,679 දරන ගැසට් පත්‍රයෙහි පළවූ 1920 අඞ්ක 1 දරණ අධ්‍යාපන ආඥාපණතේ 25වෙනි කොටස යටතේවූ අතුරු ව්‍යවස්ථාවල 5 වෙනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට මෙහි පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව යෙදීමෙන් තවදුරටත් සංශෝධනය කරනුලැබේ:—

5. පාඨශාලාවට යායුතු ළමයි.—(*a*) මියස අවුරුදු හයට වැඩිවූ හා දහහතරට අඩුවූද මඩකලපුවේ ආදායම් දිස්ත්‍රික්කය තුළ වෙසෙන්නාවූද සෑම පිරිමි ළමයකුගේ හා (*b*) වයස අවුරුදු හයෙන් වැඩිවූ හා දහයෙන් අඩුවූද එම දිස්ත්‍රික්කය තුළ වාසයකරන්නාවූද සෑම ගෑනු ළමයෙකුගේත් අධ්‍යාපනය සඳහා වෙන සෑහෙන පිළිවෙළක් යොදා තිබේ නම් මිස නොහොත් පාඨශාලාවට නොයැවීමට සෑහෙන හේතුවක් තිබේනම් මිස නැතහොත් ඒ පිරිමි ළමයා හෝ ගෑනු ළමයා පාඨශාලාවට යැවීම සෑම පියකුගේ හෝ මවකගේ යුතුකම වන්නේය:—

එහෙත් (*a*) පාඨශාලාවේ වෙනම ගෑනු ගුරුවරියක් නැත්නම් කැමතිම ගෑනු ළමයකුගේ යෑම හෝ (*b*) තමා පදිංචි ගෙය ඉතා කිට්ටු පාරෙන් පාඨශාලාවකට හැතැක්මක් දුරවූ කැමතිම ගෑනු ළමයකුගේ හෝ වයස අවුරුදු අටකින් පහළ කැමතිම පිරිමි ළමයකුගේ හෝ හැතැප්ම දෙකක් දුරවූ කැමතිම පිරිමි ළමයකුගේ හෝ යෑම හෝ (*c*) මඩකලපු අධ්‍යාපන දිස්ත්‍රික් කාර්‍යසභාවට ඒත්තුගන පරිදි ස්වකීය වැඩිදියුණුව සැලකෙන පරිද්දෙන් රැකිරක්ෂා වක නිරතව සිටින හා ස්වභාෂා පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ පස්වෙනි ප්‍රමාණයට නියමිත විභාගයෙන් තමා සාමර්ථ්‍යලත් බවට පාඨශාලා පරීක්ෂකවරයාගෙන් සහතිකයක් ලබාසිටින්නාවූ, නොහොත් අධ්‍යාපන දිස්ත්‍රික් කාර්‍යසභාවෙන් තමාගේ අසරණභාවය නිසා විශේෂ අනුමතිය ලැබූ හා ව්‍යවස්ථා පොතේ තුන්වෙනි ප්‍රමාණයට නියමිත විභාගයෙන් සාමර්ථ්‍යලත් බවට පාඨශාලා පරීක්ෂක වරයාගෙන් සහතිකයක් ලබාසිටින්නාවූ වයස දොළහටත් දහහතරටත් අතර පිරිමි ළමයකුගේ යෑම හෝ අවශ්‍යම යයි බලකරනු නොයෙදේ.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—මරදානේ අළුත් තැපැල් කන්තෝරුව සහ වැලිෆෝන් ඇක්ස්චේන්ජ් එකෙන් කක්කුස්සි පසිප්පයක් දැමීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ සරතිබෙන පංකාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරීතිබෙන බලය පිට කීසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 847. ගම—මරදාන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහන, අ, රූ, ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | වරිපනම් නො. 834ඒ ඉඩමේ කොටසක් (මරදාන පාර) | මේසන්වැඩ කරනලද උළු සෙවිලි ගෙයක්ද, තනනලද බිමක කොටසක් සහ මේසන් වැඩ කරනලද මායිම් තාප්පවල කොටස් | ජේ. ජයවර්ධන මහතා, නො. 52, වෝඩ් ප්ලේස්, කොළඹ, ඇටෝර්නි බලකාරයා, ජූලියස් සහ ක්‍රිසි සමාගම | 0 | 0 | 2·85 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1938ක්වූ ජූනි මස 22වෙනි දින පෙරවරු 10යේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1938ක්වූ මැයි මස 9වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඒ. හොබ්ඩේ,
ආණ්ඩුවේ ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ තොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ සාවශ්‍යත්තකට; ඒනම්:—ආණ්ඩුවෙන් ආධාර ලබන පාඨශාලාවක් බවද්‍ය වූ පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති ආණ්ඩුවේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් හිමිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 570. ගම—බටදූව.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | අයිතිකාරයන්නා, | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 1 | වැලිවත්ත | .. | අවුරුදු 50ක්වූ පොල්ගස් 18ක්ද, කොස්ගස් 2ක්ද, අවුරුදු 30ක්වූ කොස්ගස් 3ක්ද, දෙල්ගස් 3ක්ද, අඹගස් 1ක්ද, අවුරුදු 20ක්වූ කිතුල්ගස් 1ක්ද සහ ජම්බුගස් 1ක්ද, අවුරුදු 15ක්වූ පුවක්ගස් 22ක්ද, අවුරුදු 5ක්වූ අඹගස් 2ක්ද, ජම්බුගස් 2ක්ද, දෙහිගස් දෙකක්ද, නාරංගස් 2ක්ද, වෙරළුගස් 2ක්ද සහ අවුරුදු 3ක්වූ දොඹගස් 2ක්ද තිබෙන වත්ත | ඩබ්ලිව්. බී. ජෝසිරිස් ද සිල්වා, දන්ගෙදර | 0 2 3·2 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1938ක්වූ ජූනි මස 14වෙනි දින පෙරවරු 10යේ කනිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1938ක්වූ මැයි මස 5වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

ඒ. සී. ඇම්. හින්ග්ලි,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ තොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ සාවශ්‍යත්තකට; ඒනම්:— පාරක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති ආණ්ඩුවේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට හිමිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

උපුටාගත්තාලද 1වෙනි කොටස, අවසාන සිතියමේ නො. 1,005. ගම—වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොලහත්පත්තුවේ කටුගම්පොල දකුණුකෝරළේ කල්ගහපොත්ත.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | | අයිතිකාරයන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|
| 191 | පත්තිනිකෝට්ටුවේවත්ත | .. | කරත්තපාර | .. | වයි. ක්‍රිස්ත්‍රියන් මහතා, නො. 70, ඇල්බට් පාර, කොල්ලුපිටිය, කොළඹ | 0 1 24·4 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1938ක්වූ ජූනි මස 15වෙනි දින පෙරවරු 10 කනිසමට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1938ක්වූ මැයි මස 5වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

ආර්. එච්. බී. මැන්ඩර්ස්,
වයඹ පලාතේ ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.